# මාසික

# විවරණිකාව

2010 ජූලි



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

60 වැනි වෙළුම  07 වැනි කලාපය

**2010 ජූලි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය : ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.**

# පටුන

පිටුව


| | | | | |
|---|---|---|---|---|
| 1 වන කොටස | මාසික සිදුවීම් | ............ | ........... | 05 |
| 2 වන කොටස | පුවත්පත් නිවේදන - 2010 ජූලි | ............ | ........... | 06 |
| 1. | 2010 ජූනි මාසයේදී උද්ධමනය නොකඩවා හතරවන මාසයටත් පහළ වැටෙයි | ............ | ........... | 06 |
| 2. | වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) ඉවත්කර ගැනීමේ අභියෝගයට ශ්‍රී ලංකාව සූදානම් | ............ | ........... | 07 |
| 3. | ශ්‍රී ලංකා මහ බැංකුවේ උතුරු පළාත් කාර්යාලය විවෘත කිරීම | ............ | ........... | 08 |
| 4. | 2010 අප්‍රේල් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය | ............ | ........... | 09 |
| 5. | මුදල් ප්‍රතිපත්ති විවරණය 2010 ජූලි | ............ | ........... | 11 |
| 6. | ශ්‍රී ලංකා මහ බැංකු ණය ඇප ආවරණ ක්‍රමය ක්‍රියාත්මක කෙරේ | ............ | ........... | 12 |
| 7. | ශ්‍රී ලංකා මහ බැංකුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය - 2009 | ............ | ........... | 12 |
| 8. | කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (CCPI) | ............ | ........... | 15 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

# 2010 ජුලි

### ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත බැංකුවෙන් ලද ණය

අම්පාර දිස්ත්‍රික්ක ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 ජුලි මස 6 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත බැංකුව අතර එ.ජ.ඩොලර් මිලියන 105.19 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 11.93 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය මත වාර්ෂිකව සියයට 1 ක පොලී අනුපාතිකයක් මෙම ණය මුදල සඳහා අදාල වේ. අවුරුදු 3 ක සහන කාලයකට යටත්ව අවුරුදු 13 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### හැටන් නැෂනල් බැංකුවෙන් ලද ණය

අම්පාර දිස්ත්‍රික්ක ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 ජුලි මස 06 වැනි දින ශ්‍රී ලංකා රජය සහ හැටන් නැෂනල් බැංකුව අතර එ.ජ.ඩොලර් මිලියන 13.33 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.51 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය මත වාර්ෂිකව සියයට 5 ක පොලී අනුපාතිකයක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්යය ගෙවීමක් ද, ණය මුදලේ උපරිම අගය මත සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක්ද අදාල වේ. අවුරුදු 3 ක සහන කාලයකට යටත්ව අවුරුදු 10 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ඔස්ට්‍රියා යුනික්‍රෙඩිට් බැංකුවෙන් ලද ණය

නැගෙනහිර පළාත් දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 ජුලි 21 වැනි දින ශ්‍රී ලංකා රජය හා ඔස්ට්‍රියා යුනික්‍රෙඩිට් බැංකුව අතර යූරෝ මිලියන 8.5 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.24 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා යූරෝ අන්තර් බැංකු අර්පණ අනුපාතය මත වාර්ෂිකව සියයට 2.1 ක පොලී අනුපාතිකයක් ද, ණය මුදලින් ප්‍රයෝජනයට නොගත් ශේෂය මත වාර්ෂිකව සියයට 0.4 ක අනිවාර්යය ගෙවීමක්ද, ණය පහසුකම මත සියයට 0.6 ක කළමනාකරණ ගෙවීමක්ද අදාල වේ. අවුරුදු 2 ක සහන කාලයකට යටත්ව අවුරුදු 8.5 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### හැටන් නැෂනල් බැංකුවෙන් ලද ණය

නැගෙනහිර පළාත් දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 ජුලි 21 වැනි දින ශ්‍රී ලංකා රජය සහ හැටන් නැෂනල් බැංකුව අතර යූරෝ මිලියන 1.34 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 195.34 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා යූරෝ අන්තර් බැංකු අර්පණ අනුපාතය මත වාර්ෂිකව සියයට 4 ක පොලී අනුපාතිකයක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්යය ගෙවීමක් ද, ණය පහසුකම මත එක්වරක් පමණක් ගෙවිය යුතු සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක් ද අදාල වේ. අවුරුදු 1 ක සහන කාලයකට යටත්ව අවුරුදු 6 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

## 2 වන කොටස

# පුවත්පත් නිවේදන

## 2010 ජූලි

### 1. උද්ධමනය පිළිවෙලින් සිව්වන මාසයටත් පහළ වැටෙයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 = 100) ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2010 මැයි මස පැවති සියයට 5.3 සිට ජූනි මාසයේ දී සියයට 4.8 දක්වා පහත වැටිණි. මෙය, දර්ශකයේ පහත වැටීමක් වාර්තා කළ සිව්වන අනුයාත මාසයයි. කෙසේ වුව ද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2010 මැයි මස පැවැති සියයට 3.6 හි සිට ජූනි මාසයේ දී සියයට 3.9 දක්වා සුළු වශයෙන් ඉහළ නැගිණි.*

215.9 සිට 217.7 දක්වා දර්ශකය නිරපේක්ෂ වශයෙන් ඉහළ නැගීමත් සමග කො.පා.මි. දර්ශකය 2010 ජූනි මාසයේ දී පූර්ව මාසයට වඩා සියයට 0.8 කින් ඉහළ නැගිණි. දර්ශකයෙහි මාසික ඉහළ යෑම සඳහා ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයෙහි (සියයට 1.2) මිල ගණන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. අයහපත් කාලගුණික තත්ත්වය හා ඍතුමය සාධක හේතුවෙන් සමහර එළවළු හා මත්ස්‍ය වර්ගයන්හි සැපයුම පහත වැටීම නිසා ඇති වූ මිල ඉහළ යෑම උප දර්ශකයෙහි මෙම ඉහළ යෑම සඳහා හේතු විය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.9); විවිධ භාණ්ඩ හා සේවා ( සියයට 1.2); ප්‍රවාහන (සියයට 0.1); රෙදිපිළි හා පාවහන් (සියයට 0.5); සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු කටයුතු (සියයට 0.03) යන උප කාණ්ඩවල මිල ඉහළ යෑම් දක්නට ලැබුණු අතර සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සෞඛ්‍ය සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල මෙම මාසය තුළ නොවෙනස්ව පැවැතිණි.



## 2. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) ඉවත්කර ගැනීමේ අභියෝගයට ශ්‍රී ලංකාව සූදානම්

*මෑතකාලීන වාර්තාවලින් පෙන්නුම් කරන ආකාරයට යුරෝපා සංගමය (EU) මගින් ලබාදී තිබූ විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ වූ සහනයන් 2010 අගෝස්තු 15 වන දිනෙන් පසුව ශ්‍රී ලංකාවට නොලැබෙන අතර, මෙවැනි වාර්තාවන් පදනම් කොටගෙන විවිධ වූ මත ගොඩනැගෙමින් පවතියි. එබැවින්, ශ්‍රී ලංකාවට GSP+ සහනයේ බලපෑම සම්බන්ධයෙන් පවතින තත්ත්වය පැහැදිලි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.*

දැනට ව්‍යවස්ථාපිත ආකාරයට GSP+ ක්‍රමය මගින්, තෝරාගත් සංවර්ධනය වෙමින් පවතින රටවල් කිහිපයක් වෙතින් කිසියම් බදු සහනයන් යටතේ භාණ්ඩ ආනයනය කිරීමට, යුරෝපා සංගමයේ ගැණුම්කරුවන් වෙත අවස්ථාව සලසා දී ඇත. මෙවැනි පහසුකම් සම්පූර්ණයෙන්ම අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්වන පරිදි එකඟ වූ පහසුකම් නොවේ. එබැවින් යුරෝපා සංගමයේ බලධාරීන් විසින් කුමන අවස්ථාවක හෝ මෙවැනි පහසුකම් ඉවත් කර ගැනීමේ සැලකිය යුතු අවදානමක්, මෙම සහනය ලබා ගන්නා රටවල අපනයනකරුවන්ට පවතී.

යුරෝපා සංගම් කලාපයේ ඇතැම් ආර්ථිකයන්හි දැනට පවතින අර්බුදයන් හේතුවෙන් යුරෝපා සංගමය විසින් ලබාදෙන මෙවැනි පහසුකම් තවදුරටත් ඉදිරියට පවත්වාගෙනයාමේ අපහසුතාවයක් පවතී. GSP+ පහසුකම තවදුරටත් ලබාගැනීම සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිතතාවයන් පිළිබඳව අදාළ සියළුම අංශ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරන්තරයෙන්ම දැනුවත් කර ඇති අතර, මෙම ක්‍රමය අනිවාර්යයෙන්ම ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වන බැවින් ඒ සඳහා සූදානම් වන ලෙස ද සැමට උපදෙස් ලබා දී ඇත.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය වසර දෙකක කාලය තුළ දී මෙම කරුණ පුළුල් වශයෙන් සාකච්ඡාවට භාජනය කර ඇති අතර, රජය, ශ්‍රී ලංකා මහ බැංකුව මෙන්ම යුරෝපා සංගමය වෙත අපනයනයන් සිදු කරන බොහොමයක් ශ්‍රී ලාංකීය අපනයනකරුවන් ද, මේ වන විටත් මෙම අවදානමට මුහුණදීමට හැකි වන ලෙස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

මෙවැනි ක්‍රියාමාර්ග කිහිපයක් පහතින් දක්වා ඇත;

- යුදමය වාතාවරණය අවසන්වීමත් සමග ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය සහ ආයෝජක විශ්වාසය සැලකිය යුතු අන්දමින් වර්ධනය වීම.

- සාර්ව ආර්ථික මූලධර්ම සියල්ලක්ම පාහේ ස්ථායීවීම සහ වර්ධනය වීම. විශේෂයෙන්;

  - උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගැනීම තුළින් යෙදවුම් පිරිවැය මත ඇති පීඩනය සැලකිය යුතු අන්දමින් අඩු කිරීම;
  - පොලී අනුපාතිකයන් අඩු මට්ටමක පවත්වාගෙන යාම මගින් ණය පිරිවැය සැලකිය යුතු අන්දමින් අඩු කිරීම;
  - විදේශ සංචිත ඓතිහාසික ලෙස ඉහළ මට්ටමක් දක්වා වැඩි කරගැනීම තුළින් ශ්‍රී ලාංකීය ආර්ථිකය කෙරෙහි ආයෝජකයින්ගේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම;
  - ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය ස්ථායීව පවත්වා ගැනීම මගින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම;

- ශ්‍රී ලාංකීය ව්‍යාපාරයන්ට, සිය මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා අඩු පිරිවැයක් සහිතව ණය ගැනීමට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ හා ණය වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම;
- දේශපාලන ස්ථාවරත්වය ළඟාකර ගැනීම තුළින් තවදුරටත් විශ්වාසනීයත්වය වර්ධනය කිරීම හා ප්‍රතිපත්ති පිළිබඳව ඇති අවිනිශ්චිතතාවයන් අඩු කිරීම;
- ප්‍රතිරක්ෂණ ආයතන විසින් ශ්‍රී ලංකාව වැඩි යුද අවදානමක් ඇති රටක් ලෙස ලැයිස්තුගත කිරීමෙන් ඉවත් කර ගැනීම;
- අපනයන ආයතනවල අභ්‍යන්තර ක්‍රියාවලීන් සහ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම තුළින් සැලකිය යුතු ලෙස ඵලදායීතාවය වර්ධනය කිරීම.

මේ අනුව, වෙළෙඳපොළ විවිධාංගීකරණය, ගැණුම්කරුවන් සමග සාකච්ඡා කිරීම, ඵලදායීතාවය වැඩි කිරීම සහ මූල්‍යමය හා යෙදවුම් පිරිවැය අඩු කිරීම ආදී සෘජු මට්ටමේ පියවරවලට අමතරව මතුව ඇති මෙම තත්ත්වයන්ට මුහුණදීම සඳහා අවධානය යොමු කිරීමෙන්, දීර්ඝකාලීනව සැලසුම් ගතවීමක් මගින් GSP+ සහනය ඉවත් කර ගැනීමෙන් ඇති විය හැකි අඩු තරගකාරිත්වය ක්‍රමයෙන් සමනය වනු ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විශ්වාසයයි.

වාර්තාවන්ට අනුව 2009 වසරේ දී යුරෝපා සංගමය වෙත කරන ලද ඇගළුම් අපනයන වල වටිනාකම සම්පූර්ණ ඇගළුම් අපනයන වටිනාකමින් සියයට 50 ක් පමණ වේ. එම අපනයනයන්ගෙන් සියයට 60 ක් පමණ GSP+ සහනයේ වාසිය ලබාගත් අතර ඉතිරිය GSP+ සහනය රහිතව යුරෝපා සංගමය වෙත අපනයනය කරන ලදී. GSP+ සහනයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපා සංගමයේ ගැණුම්කරුවන්ට ලැබුණු ශුද්ධ වාසිය දළ වශයෙන් යුරෝ මිලියන 78 ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත.

අර්බුදකාරී තත්ත්වයන් දරාගැනීමේ හැකියාව ශ්‍රී ලාංකේය කර්මාන්තයන් විසින් මීට පෙර අවස්ථාවලදී ද තහවුරු කර ඇති බව සඳහන් කළයුතු වේ. බහු කෙඳි ගිවිසුම අහෝසිවීමේ කාලසීමාව තුළ විශේෂයෙන්ම ඇඟළුම් අංශය, අඩු පිරිවැයකින් ඇඟළුම් නිෂ්පාදනය කරන අනෙකුත් රටවල් සමග පැවැති දැඩි තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට සමත් විය. එම වකවානුවේ දී ඔවුන් නව අභියෝගාත්මක අවස්ථාවන්ට යෝග්‍ය ලෙස සකස් වූවා පමණක් නොව, විවිධ අවදානම්වලදී මනාලෙස කටයුතු කළ හැකි වන අයුරින් ශක්තිමත්ව ලෝක වෙළෙඳපොළ තුළ තම කොටස තවදුරටත් වැඩි කර ගැනීම ද සිදු කරන ලදී. මේ අයුරින්ම, ඉහතින් සඳහන් කර ඇති ක්‍රියාමාර්ගයන්ගේ බලපෑමත් සමග GSP+ ප්‍රතිලාභ අහෝසි වුවහොත් මතුවිය හැකි අභියෝග ජයගෙන වඩාත් ශක්තිමත් ලෙස නැගී සිටීමට ශ්‍රී ලාංකේය කර්මාන්තවලට හැකි වනු ඇත.

## 3. ශ්‍රී ලංකා මහ බැංකුවේ උතුරු පළාත් කාර්යාලය විවෘත කිරීම

*ශ්‍රී ලංකා මහ බැංකුව සිය සිව්වන පළාත් කාර්යාලය 2010 ජූලි මස 04 වන දින උතුරු පළාතෙහි යාපනය, අරසඩි පාර, අංක 105 දරන ස්ථානයේ විවෘත කරන බව දන්වා සිටී. දැනට දකුණ, උතුරු-මැද හා මධ්‍යම පළාත්වල මහ බැංකුවේ පළාත් කාර්යාල පවත්වාගෙන යයි.*

එම පළාත් කාර්යාලයන්හි මූලික කාර්යයන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති සංවර්ධන ණය යෝජනා ක්‍රම, අදාළ පළාත්වල ක්‍රියාත්මක කිරීමයි. මෑත කාලයේදී සංවර්ධන ණය අවශ්‍යතාවයන් සපුරාලීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සහිත ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කොට ඇත. කෘෂිකර්මය, සත්ත්වපාලනය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නංවාලීම, ස්වයංරැකියා උත්පාදනය හා දිළිඳුබව පිටුදැකීම අරමුණුකොට ප්‍රධාන වශයෙන් මෙම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කොට ඇත. එවැනි ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට අමතරව මෙම පළාත් කාර්යාල සීමිත වූ මහ බැංකු කටයුතු ක්‍රියාත්මක කිරීම හා ආයෝජකයින්, ගුරුවරුන්, පාසැල් සිසුන් හා සාමාන්‍ය ජනතාවගේ බැංකු හා මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සිදු කරනු ලබයි.

"උතුරු වසන්තය" කඩිනම් සංවර්ධන වැඩ සටහන යටතේ බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන එම ප්‍රදේශයන්හි දැනටමත් පදිංචිව සිටින හා නැවත පදිංචි කරන ලද ජනතාව වෙත මූල්‍යමය සේවාවන් සැපයීමේදී ඉතා වැදගත් සේවාවක් ඉටුකරනු ලබයි. ඒ අනුව උතුරු පළාත තුළ පිහිටුවනු ලබන මහ බැංකු පළාත් කාර්යාලය එම පළාතේ ආර්ථිකමය හා මූල්‍ය අංශයේ සංවර්ධනය සාක්ෂාත් කරගැනීම උදෙසා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

උතුරු පළාත තුළ කෘෂිකාර්මික, සත්ත්ව පාලනය, ධීවර යන අංශයන්හි සංවර්ධනය උදෙසා පුළුල් ඉඩප්‍රස්ථාවන් පවත්නා බව සළකනු ලබන හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංවර්ධන ණය යෝජනා ක්‍රම බොහොමයක් එම අංශයන් වෙත මූල්‍ය පහසුකම් සැපයීම සඳහා යොමුකොට තිබේ. එයට අමතරව, සංචාරක කර්මාන්තය නංවාලීම සඳහා පවතින පුළුල් විභවතාවයන් සහ ඉතා වටිනා ඛණිජ ද්‍රව්‍ය එම ප්‍රදේශවලින් සපයාගත හැකිවීම සැලකිල්ලට ගත් විට ඒවා එම ප්‍රදේශයේ රැකියා උත්පාදනයට හා නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනයට වැදගත් මූලාශ්‍රයන් ලෙස උපයෝගී කරගත හැකිය.

එසේ හෙයින් මහ බැංකුවේ නව පළාත් කාර්යාලය විවෘත කිරීම තුළින් උතුරු පළාතේ සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසනු ඇත. එමගින් මහ බැංකු සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන මූල්‍ය ආයතන හා වෙනත් ආයතනයන්හි ඵලදායී දායකත්වයක් ලබා ගනිමින්, පවත්නා සම්පත් ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් කාර්යක්ෂම ලෙස උපයෝගී කරගැනීමට හැකිවනු ඇත.

## 4. 2010 අප්‍රේල් මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය

*පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2010 අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම සහ ආනයන වියදම සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2010 අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 543 දක්වා සියයට 24.2 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රධාන ලෙස දායක වූයේ කාර්මික සහ කෘෂිකාර්මික අංශවල අපනයන ආදායම ඉහළ යාමයි. 2010 අප්‍රේල් මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 967 දක්වා සියයට 55.8 කින් වර්ධනය විය. ඒ අනුව, 2010 අප්‍රේල් මාසයේ දී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් මිලියන 424 ක් විය. සමුච්චිත අපනයන ආදායම හා ආනයන වියදම පළමු මාස හතර තුළදී පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 2,307 දක්වා සියයට 10.7 කින් සහ එ.ජ.ඩොලර් මිලියන 4,192 දක්වා සියයට 42.9 කින් වර්ධනය විය.*




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

අප්‍රේල් මාසයේ අපනයන වර්ධනය සඳහා විශාලතම දායකත්වය කාර්මික අංශයේ අපනයන මගින් ලැබුණු අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අපනයනයන්ගේ සිදු වූ සැලකිය යුතු වර්ධනය මේ සඳහා මූලික විය. ප්‍රධාන වශයෙන් බෝට්ටු, බයිසිකල් සහ පරිණාමක, ස්ථාවර පරිවර්තක, ප්‍රේරක සහ පරිවරණීය රැහැන් ආදී විද්‍යුත් උපකරණ මෙයට ඇතුළත් වේ. රබර් නිෂ්පාදන, ඛනිජ තෙල් නිෂ්පාදන සහ දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන ආදායම ද යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී. රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයන්ට සාපේක්ෂව අඛණ්ඩව හත්වන වතාවටත් පහත වැටුණ ද එය 2010 අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 227 ක් දක්වා ආන්තික වශයෙන් වර්ධනය විය. ආහාර, පාන හා දුම්කොළ අපනයන ආදායම සියයට 7.3 කින් පහත වැටුණු අතර, මේ සඳහා මූලික වශයෙන්ම හේතු වූයේ අළුත් හා ශීතකළ මත්ස්‍ය අපනයන පහත වැටීමයි. 2010 අප්‍රේල් මාසයේ දී අපනයන සඳහා සියයට 24.4 ක දායකත්වයක් ලබාදුන් කෘෂිකාර්මික අපනයන පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළ අතර, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තේ, පොල් සහ සුළු කෘෂිකාර්මික අංශයන්ගේ මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම හේතුවෙන් මෙම අපනයනයන්ගේ යහපත් ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කරන ලදී. ජාත්‍යන්තර වෙළෙඳපොළේ පැවැති ඉහළ තෙල් මිල ගණන්වලට සමගාමීව 2009 අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් 1.39 ක්ව පැවැති ස්වභාවික රබර් කිලෝ ග්‍රෑමයක මිල 2010 අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් 3.16 දක්වා සියයට 126.7 කින් වර්ධනය විය. කෙසේ වුවත්, 2010 අප්‍රේල් මාසයේ දී පැවැති අයහපත් කාලගුණික තත්ත්වය රබර් සැපයුම කෙරෙහි බලපාන ලදී.

2010 අප්‍රේල් මාසයේ දී සියළුම ප්‍රධාන කාණ්ඩයන්ගේ ආනයන ඉහළ ඉල්ලුමක් පිළිබිඹු කරමින් වර්ධනය විය. ඛනිජතෙල් සහ පොහොර ආනයනය හේතුවෙන් අන්තර්භාණ්ඩ ආනයන වියදම ඉහළ යන ලදී. 2009 අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් 54.45 ක් ව පැවැති බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2010 අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් 85.02 ක් දක්වා සියයට 56.1 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 63.6 කින් ඉහළ ගිය අතර, සීනි, කිරි නිෂ්පාදන සහ අනෙකුත් ආහාර කාණ්ඩයන්ගේ ආනයනය සඳහා වූ වියදම වැඩිවීම මේ සඳහා හේතු විය. ජාත්‍යන්තර වෙළෙඳපොළේ කිරි නිෂ්පාදනයන්ගේ මිල ගණන් ඉහළයාමේ නැඹුරුතාවයක් පෙන්නුම් කරමින් 2010 අප්‍රේල් මාසයේ දී කිරි නිෂ්පාදන ආනයන වියදම සියයට 258.6 කින් වර්ධනය විය. 2010 අප්‍රේල් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම වර්ධනය වූ අතර, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන උපකරණ, විශේෂයෙන්ම යතුරු පැදි, විද්‍යුත් උපකරණ සහ මුද්‍රණ යන්ත්‍ර ආදී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මේ සඳහා හේතු විය.

2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2010 පළමු මාස හතර තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 1,199 දක්වා සියයට 14.5 කින් වර්ධනය විය. 2010 අප්‍රේල් මාසය අවසන් වන විට ආසියානු නිෂ්කාශණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 5,440 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 5,215 ක් ලෙස වාර්තා විය. පසුගිය මාස 12

තුළ පැවැති සාමාන්‍ය ආනයන මසකට එ.ජ.ඩොලර් මිලියන 955 ක් වූ අතර, ආසියානු නිෂ්කාශණ සංගමයේ අරමුදල් රහිත දළ නිල සංචිත ප්‍රමාණය මාස 5.5 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

මෙම කාලපරිච්ඡේදය තුළ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා දී ඇත.

## විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරිත්වය - 2010 අප්‍රේල් සහ 2010 ජනවාරි - අප්‍රේල්

| | 2009 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2010 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | අප්‍රේල් වර්ධනය (සියයට) | 2009 ජනඃ සිට අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2010 ජනඃ සිට අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | ජනඃ සිට අප්‍රේල් වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **437.6** | **543.5** | **24.2** | **2,085.0** | **2,307.0** | **10.7** |
| කෘෂිකාර්මික | 86.2 | 132.5 | 53.7 | 449.5 | 601.5 | 33.8 |
| මෙයින් තේ | 58.2 | 93.7 | 61.0 | 300.4 | 399.3 | 32.9 |
| කාර්මික | 347.2 | 406.1 | 16.9 | 1,611.9 | 1,674.7 | 3.9 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 227.0 | 227.5 | 0.2 | 1,053.2 | 930.7 | -11.6 |
| ඛනිජ ද්‍රව්‍ය | 4.2 | 4.9 | 17.7 | 23.6 | 30.8 | 30.6 |
| **ආනයන** | **620.7** | **967.1** | **55.8** | **2,933.1** | **4,191.9** | **42.9** |
| පාරිභෝගික භාණ්ඩ | 121.3 | 198.4 | 63.6 | 630.6 | 938.6 | 48.8 |
| මෙයින් ආහාර හා පාන වර්ග | 69.2 | 135.1 | 95.2 | 407.0 | 656.7 | 61.3 |
| මෙයින් අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 52.0 | 63.2 | 21.5 | 223.6 | 281.9 | 26.1 |
| අන්තර් භාණ්ඩ | 356.5 | 581.8 | 63.2 | 1,454.0 | 2,267.5 | 56.0 |
| මෙයින් ඛනිජ තෙල් | 122.6 | 282.7 | 130.6 | 485.9 | 1,034.7 | 112.9 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 103.3 | 109.9 | 6.4 | 434.7 | 477.1 | 9.7 |
| ආයෝජන භාණ්ඩ | 130.9 | 178.7 | 36.5 | 804.8 | 870.2 | 8.1 |
| මෙයින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 59.7 | 77.0 | 29.0 | 338.3 | 362.4 | 7.1 |
| මෙයින් ප්‍රවාහන උපකරණ | 15.0 | 35.8 | 139.1 | 130.6 | 171.8 | 31.6 |
| මෙයින් ගොඩනැගිලි ද්‍රව්‍ය | 39.4 | 46.7 | 18.5 | 252.0 | 242.5 | -3.8 |
| **වෙළෙඳ ශේෂය** | **-183.0** | **-423.6** | **131.5** | **-848.1** | **-1,884.9** | **122.2** |
| **සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **266.3** | **308.2** | **15.7** | **1,046.9** | **1,198.8** | **14.5** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## 5. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 ජූලි

*මුදල් මණ්ඩලය විසින් 2010 ජූලි 9 වැනි දින පැවති සිය මුදල් මණ්ඩල රැස්වීමේදී එදින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පදනම් අංක 25 බැගින් පිළිවෙලින් සියයට 7.25 සහ සියයට 9.50 දක්වා පහත දැමීමට තීරණය කරන ලදී.*

උද්ධමනය ක්‍රමයෙන් අඩුවීම හා ආර්ථික කටයුතු මන්දගාමීවීම සැලකිල්ලට ගනිමින් 2009 වසර තුළදී මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමයෙන් ලිහිල් කරන ලදී. මහ බැංකුව විසින් ගන්නා ලද මෙම ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර ලෙස ආර්ථිකයේ හිතකර ප්‍රවණතා කිහිපයක්ම දක්නට ලැබිණ.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (පදනම් වසර=2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, අඛණ්ඩව සිව්වන වරටත් පහත බසමින් 2010 ජූනි මාසයේදී සියයට 4.8 ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 3.9 ක් විය. දේශීය කෘෂිකාර්මික අංශයේ පැවති යහපත් වර්ධනය මෙන්ම අන්තර්ජාතික වෙළෙඳපොළෙහි ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අඩුවීම කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත යහපත් බලපෑමක් ඇති කරන ලදී. වසරේ ඉදිරි කාලය තුළදී ද උද්ධමනය තනි අංකයකට සීමා වෙනු ඇතැයි අපේක්ෂිතය.

වසරේ මුල් මාස පහ තුළ පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය අඩු වෙමින් පැවතිණ. 2009 අගදී එහි පැවති සියයට 18.6 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2010 මැයි අග වන විට එය සියයට 15.5 දක්වා පහත වැටිණි. පෞද්ගලික අංශයට දුන් බැංකු ණය 2009 අග භාගයේ සිට ඉහළ යමින් පැවතුනු අතර, 2009 අග පැවති සියයට 5.7 ක සෘණ වර්ධනයට සාපේක්ෂව 2010 මැයි අවසානය වන විට සියයට 3.5 කින් වර්ධනය විය. ආර්ථික වර්ධනය ඉහළ යාමත් සමග පෞද්ගලික අංශය වෙත ලැබෙන ණය ප්‍රමාණය අඛණ්ඩව ඉහළ යාම වැදගත් වේ. විදේශ වෙළෙඳාම් අංශය ද 2010 පළමු මාස හතර තුළ යළි යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, මෙම කාලය තුළදී අපනයන සියයට 10.7 කින් හා ඛනිජ තෙල් නොවන ආනයන සියයට 29 කින් ඉහළ ගොස් ඇත. විදේශ විනිමය හුවමාරු ඇතුළත් දළ නිල සංචිත ප්‍රමාණය අන්තර් ජාතික මූල්‍ය අරමුදලෙහි සම්පස්ථ ණය පහසුකම යටතේ තවත් වාරික 2 ක් ලැබීමත් සමග තවදුරටත් ඉහළ ගිය අතර, එය 2010 ජූනි 30 වන විට එ.ජ.ඩොලර් බිලියන 5.7 ක් විය. මෙය මාස 6 ක පමණ ආනයන මූල්‍යනයට ප්‍රමාණවත් වේ. 2010 පළමු කාර්තුවේදී ආර්ථිකය සියයට 7.1 කින් වර්ධනය වූ බව ඇස්තමේන්තු කර ඇති අතර, 2010 වර්ෂයේදී ආර්ථිකය සියයට 7 කින් පමණ වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ මෙම වර්ධනයන් සැලකිල්ලට ගනිමින් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබීය. මෙයට ප්‍රතිචාර වශයෙන් ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහාය වනු පිණිස වාණිජ බැංකුවල ණය පොලී අනුපාතික තවදුරටත් පහතට සංශෝධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පසුකාලීනව ආර්ථිකයේ ඇති වූ යම් වර්ධනයන් සැලකිල්ලට ගනිමින් 2010 සඳහා වූ මුදල් වැඩ සටහන ද සංශෝධනය කිරීමට මහ බැංකුව තීරණය කර ඇති අතර, මේ අනුව, “2010 හා ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම” තුළින් ප්‍රකාශයට පත් කරන ලද සංචිත හා පුළුල් මුදල් සඳහා වන ඉලක්ක ද සංශෝධනය කර ඇත. මෙම සංශෝධනයට ප්‍රධානතම හේතුන් වනුයේ නාමික දළ දේශීය නිෂ්පාදිතයේ අපේක්ෂිත ඉහළ යාමත්, 2010 ජූනි මසදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2010 අයවැය සමඟ රාජ්‍ය මූල්‍ය අංශයේ තොරතුරු ලැබීමත් ය. නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 14.5 ලෙස සංශෝධනය කර ඇති අතර ඊට අනුකූල අගයකින් පුළුල් මුදල් සැපයුම වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. 2010 සඳහා වන අයවැයෙහි හිඟය සියයට 8 කට සීමා කිරීමට අපේක්ෂා කරන අතර, 2011 හා ඉදිරියේදී එය තවදුරටත් පහත බසිනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසරේ ප්‍රථම භාගය තුළ මුදල් සමස්තයන්හි දක්නට ලැබුනු ඇතැම් වර්ධනයන් ද සංශෝධනයක අවශ්‍යතාව පෙන්නුම් කරන ලදී. යුද්ධය අවසන් වීමත් සමඟ ඉහළ යන ලද ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුමෙහි බලපෑම ද යම් දුරකට පාදක වෙමින් විශේෂයෙන්ම 2010 පළමු කාර්තුව තුළදී සංචිත මුදල් හි වර්ධනය අපේක්ෂිත මට්ටම ඉක්මවා යන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුදල් ගුණකයෙහි ද අඩුවීමක් පෙන්නුම් කෙරෙන අතර, මේ අනුව, පුළුල් මුදල් සැපයුම ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීම සඳහා වැඩි සංචිත මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වේ. මෙම වර්ධනයන් සැලකිල්ලට ගනිමින් 2010 තෙවන හා අවසාන කාර්තු තුළ දී සංචිත මුදල් සඳහා අදාළ වන කාර්තුමය සාමාන්‍යය පිළිබඳ ඉලක්ක පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති විවරණය 2010 අගෝස්තු 20 ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

### සංචිත මුදල් සඳහා වන සංශෝධිත ඉලක්ක - 2010 (කාර්තුමය සාමාන්‍යය)

| | සංශෝධිත ඉලක්ක - 2010 | | |
|---|---|---|---|
| | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | වාර්ෂික සාමාන්‍යය |
| රුපියල් බිලියන | 335.8 | 350.3 | 334.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය % | 21.6 | 19.7 | 21.2 |

## 6. ශ්‍රී ලංකා මහ බැංකු ණය ඇප ආවරණ ක්‍රමය ක්‍රියාත්මක කෙරේ.

*ලියාපදිංචි මුදල් සමාගම් කිහිපයක මුහුණ දුන් ද්‍රවශීලතා ගැටළුවලට මූලික විසඳුමක් වශයෙන් 2010 ජනවාරි මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ඇප ආවරණ ක්‍රමයක් ස්ථාපනය කරන ලදී.*

එකී ණය ඇප ආවරණ ක්‍රමය යටතේ ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට සිය දේපළ සහ මූල්‍ය වත්කම්වලට එරෙහිව බැංකු ආයතන මගින් ණය ලබා ගැනීමෙන් සිය ද්‍රවශීලතා තත්ත්වය වැඩි දියුණු කර ගැනීමටත්, එමගින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු නොකඩවා පවත්වාගෙන යාමටත් අවස්ථාව සැලසී ඇත. ඇතැම් ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සතුව දේපල වත්කම් ඇති බැවින්, මෙම ක්‍රමය යටතේ එවැනි සමාගම්වලට ඉක්මන් ද්‍රවශීලතා පහසුකම් ලබාගත හැකි අතර එමගින් සිය වගකීම් සපුරා ව්‍යාපාර කටයුතු ක්‍රමිකව වැඩි දියුණු කරගත හැකි වනු ඇත.

දැනට, මෙම ඇප ආවරණ ක්‍රමය යටතේ ණය ලබාගැනීමට ලියාපදිංචි මුදල් සමාගම් කිහිපයක් ම බැංකු සමඟ සාකච්ඡා කරමින් සිටී. මෙම සාකච්ඡා ඉතා කෙටි කාලයක් ඇතුළත අවසන් වේ යැයි අපේක්ෂාකරන අතර, ඒ යටතේ ප්‍රථම ණය පහසුකම ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම විසින් 2010 ජූලි මස 15 වන බ්‍රහස්පතින්දා දින ලබා ගනු ඇත.

මෙම ඇප ආවරණ ක්‍රමය යුහුසුළුව ප්‍රයෝජනයට ගන්නා මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි මුදල් සමාගම් සහ අදාළ බැංකු ක්‍රියාකාරීව දිරිගන්වන අතර, ඇප ආවරණ ක්‍රමය යටතේ ලබාගන්නා ණය පහසුකම් මඟින් එකී ලියාපදිංචි මුදල් සමාගම්වලට සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට සහ/හෝ නොකඩවා පවත්වාගෙන යාමට හැකි වෙතැයි අපේක්ෂා කරයි. සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම සහ බලගැන්වීම මඟින් ලියාපදිංචි මුදල් සමාගම්වලට සිය ණයහිමියන්ගේ වගකීම් ඉටු කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කරන අතර, එකී වාතාවරණය තැන්පතුකරුවන්, ණයහිමියන්, කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකාර භවතුන් ඇතුළු සියළු උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ සුබසිද්ධියට හේතුවේ යැයි මහ බැංකුව අපේක්ෂා කරයි.

## 7. ශ්‍රී ලංකා මහ බැංකුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය - 2009

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදිත, පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, 2009 වර්ෂය සඳහා පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) සම්පාදනය කර ඇත. 2009 වසරේදී පවත්නා මිල අනුව සමස්ත ද.දේ.නි. රුපියල් බිලියන 4,825 ක් දක්වා සියයට 9.4 කින් වර්ධනය වූ අතර, ඒක පුද්ගල ආදායම රුපියල් 235,945 ක් (ඇමෙරිකානු ඩොලර් 2,053) විය. පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය සංඛ්‍යා සටහන 1 හි දක්වා ඇත.*

**සංඛ්‍යා සටහන 1**
**පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතයේ සුවිශේෂී ලක්ෂණ (පවත්නා වෙළෙඳපොළ මිල අනුව) 2008[1] සහ 2009[2]**

| අයිතමය/පළාත | වසර | බස්නාහිර | මධ්‍යම | දකුණ | උතුර | නැගෙනහිර | වයඹ | උතුරු මැද | ඌව | සබරගමුව | දිවයින |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ද.දේ.නි.(රුපියල් බිලියන) | 2008 | 2,003 | 431 | 465 | 139 | 246 | 439 | 207 | 200 | 281 | 4,411 |
| | 2009 | 2,178 | 465 | 492 | 159 | 281 | 495 | 232 | 220 | 303 | 4,825 |
| ද.දේ.නි. වර්ධන අනුපාතය (%) | 2008 | 20.4 | 25.2 | 23.1 | 33.4 | 32.9 | 24.0 | 45.0 | 13.1 | 22.0 | 23.2 |
| | 2009 | 8.7 | 8.1 | 5.9 | 14.1 | 14.0 | 12.8 | 12.1 | 10.0 | 7.8 | 9.4 |
| ද.දේ.නි. දායකත්වය(%) | 2008 | 45.4 | 9.8 | 10.5 | 3.2 | 5.6 | 9.9 | 4.7 | 4.5 | 6.4 | 100.0 |
| | 2009 | 45.1 | 9.6 | 10.2 | 3.3 | 5.8 | 10.3 | 4.8 | 4.6 | 6.3 | 100.0 |
| ඒක පුද්ගල ආදායම (රුපියල් දහස්) | 2008 | 348 | 164 | 190 | 119 | 163 | 191 | 171 | 155 | 148 | 218 |
| | 2009 | 375 | 175 | 199 | 134 | 183 | 213 | 189 | 168 | 157 | 236 |
| ඒක පුද්ගල ආදායම් අනුපාතය [3] | 2008 | 1.6 | 0.8 | 0.9 | 0.5 | 0.7 | 0.9 | 0.8 | 0.7 | 0.7 | 1.0 |
| | 2009 | 1.6 | 0.7 | 0.8 | 0.6 | 0.8 | 0.9 | 0.8 | 0.7 | 0.7 | 1.0 |

1. සංශෝධිත
2. තාවකාලික
3. පළාතේ ඒක පුද්ගල ආදායම, දිවයිනේ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස

2009 වසරේ දී බස්නාහිර පළාත සමස්ත ද.දේ.නි. යට ඉහළම ආයකත්වයක් දක්වන ලදී. කෙසේ වුව ද, එම පළාත මගින් ද.දේ.නි.යට ලබාදුන් ආයකත්වය 2008 වසරේ දී වූ සියයට 45.4 (සශෝධිත) සිට සියයට 45.1 දක්වා තවදුරටත් අඩු විය. 2008 වසර හා සැසඳීමේ දී 2009 වසරේ දී වයඹ සහ දකුණු පළාත් තම තමන්ගේ ස්ථානයන් හුවමාරු කරගත් අතර, වයඹ පළාත මෙම වසරේ ද.දේ.නි. යට දෙවන ඉහලම ආයකත්වය ලබාදුන් පළාත බවට පත් විය. 2008 වසරේ දී දකුණු පළාත දෙවන ඉහළම ආයකත්වය ලබාදුන් අතර එය සියයට 10.5 ක් විය කෙසේ නමුත්, එය 2009 වසරේ දී සියයට 0.2 දක්වා පහළ වැටුණු අතර දකුණු පළාත තුන්වන ස්ථානයට පත් විය. තව ද, මධ්‍යම සහ සබරගමුව පළාත් ද.දේ.නි. යට දක්වන ලද ආයකත්වය 2009 වසරේදී අඩු විය. මධ්‍යම සහ සබරගමුව පළාත් ද.දේ.නි. යට දක්වන ලද ආයකත්වය 2008 වසරේ දී වූ සියයට 9.8 සහ සියයට 6.4 2009 වසරේ දී පිළිවෙළින් සියයට 9.6 සහ සියයට 6.3 දක්වා පහත වැටුණි. වයඹ පළාත දක්වන ලද ආයකත්වය 2008 වසරේ දී වු සියයට 9.9 සිට සියයට 9.6 සහ සියයට 6.3 දක්වා පහත වැටුණි. වයඹ පළාත දක්වන ලද ආයක්වය 2008 වසරේ දී වු සියයට 9.9 සිට සියයට 103 ක් දක්වා ඉහළ නැගුණි. 2008 වසරේ දී වූ සියයට 3.2 ආයක්වය හා සැසඳීමේදී 2009 වසරේ උතුරු පළාතේ ද.දේ.නි. යට දක්වන ලද ආයකත්වය සියයට 3.3 දක්වා සුළු වශයෙන් වර්ධනය විය. මෙය අවුරුදු 3ක් පුරාවට පැවැති ගැටුම්කාරි වාතාවරණය අවසාන වීමත් සමඟ නිරීක්ෂණය කළ හැකි වූ ධනාත්මක වර්ධනයකි. සිවිල් යුද්ධය අවසාන වීමත් සමඟ පාරිභෝගික සහ ආයෝජක විශ්වාසය ඉහළ යාම තුළින් ආර්ථිකයට බලපෑමක් ඇති කිරීමට කාලයක් ගත වන හෙයින් මෙම වසරේ දී සමස්ත ද.දේ.නි. යට උතුරු පළාත මගින් දක්වන ලද ආයකත්වයේ පැහැදිලි ප්‍රසාරණයක් දක්නට නොමැත. මේ අතර, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත් වෙන වෙනම සමස්ත ද.දේ.නි. යට දක්වන ලද ආයකත්වයක් තවමත් සියයට 6 කටත් අඩු මට්ටමක පැවතිය ද මෙම පළාත් තුනෙහිම ආයකත්වයේ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම පළාත් තුළ ද.දේ.නි. යට දක්වන ලද ආයකත්වය 2000 වසරේ දී වු සියයට 5.6, සියයට 4.7 සහ සියයට 4.5 හා සැසැඳීමේ දී 2009 වසරේද පිළිවෙළින් සියයට 5.8, සියයට 4.8 සහ සියයට 4.6 ක් විය.

වරාය, ගුවන් තොටුපොළ, බැංකු සහ මූල්‍ය ආයතන සහ ව්‍යාපාරික ස්ථාන හා සම්බන්ධ ආර්ථික කටයුතු බොහොමයක් තවමත් බස්නාහිර පළාත තුළ කේන්ද්‍රගතවීමේ ප්‍රතිඵලයක් ලෙස එම පළාත ද.දේ.නි. යට සුවශේෂී ආයකත්වයක් සපයා දෙනු ලැබිණි. මේ වන තෙක් බස්නාහිර පළාත ද.දේ.නි. ට ඉහළම ආයකත්වයක් ලබා දුන් නමුත් 2009 වසරේ දී පළාත් අතර විෂමතාවයෙහි අඩු වීමක් පෙන්නුම් කෙරේ.






උතුර, නැගෙනහිර, වයඹ, උතුරු මැද සහ ඌව පළාත් 2009 වසරේ ද නාමික වර්ධනයක් අත්පත් කරගෙන ඇත. බස්නාහිර පළාත සමස්ත ද.දේ.නි. යට ඉහළ ම දායකත්වයක් ලබා දුන්න ද උතුර, ඌව සහ උතුරු මැද යන පළාත් හා සැසඳීමේදී සියයට 8.7 ක් වැනි සාපේක්ෂ මන්දගාමී වේගයකින් වර්ධනය වී ඇත. කෙසේ වුවත් දකුණ (සියයට 5.9), සබරගමුව (සියයට 7.8) හා මධ්‍යම (සියයට 8.1) අඩු වේගවලින් වර්ධනය වී ඇති අනෙකුත් පළාත් වේ. බස්නාහිර පළාතේ ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 3,259ක් වන අතර 2008 සහ 2009 යන දෙවසර තුළම දිවයි-නේ ඒක පුද්ගල ආදායම මෙන් 1.6 ගුණයක් විය. අනෙකුත් සියළුම පළාත්වල ඒක පුද්ගල ආදායම දිවයිනේ ඒක පුද්ගල ආදායමට පහළින් පැවතිණි. 2009 වසරේ උතුරු හා නැගෙනහිර පළාත්වල ඒක පුද්ගල ආදායම දිවයිනේ ඒක පුද්ගල ආදායමට දරණ අනුපාතයන්හි ආන්තික වර්ධනයක් පෙන්නුම් කෙරුණු අතර මධ්‍යම හා දකුණු පළාත්වල අනුපාතයන් ආන්තික අඩු වීමක් පෙන්නුම් කෙරිණි (සංඛ්‍යා සටහන 1) පළාත්වල ද.දේ.නි. යේ ආංශික දායකත්වයන් සංඛ්‍යා සටහන 2 හි දැක්වේ. 2009 වසරේ දී බස්නාහිර පළාත, ආසන්නතම පළාත් හතර සහ පිටතින් වූ පළාත් හතරේ ද.දේ.නි. යට කෘෂිකාර්මික අංශය මගින් ලබා දුන් දායකත්වය 2008 වසර හා සසඳන කළ ඉතා සුළු පහළ යාමක් පෙන්නුම් කෙරුණි. බස්නාහිර පළාතේ ක්‍රියාකාරීත්වය සඳහා කාර්මික හා සේවා අංශයන්ගෙන් සුවිශේෂී දායකත්වයක් ලැබුණු අතර, එම පළාතේ ද.දේ.නි. යට කෘෂිකාර්මික අංශයෙන් ලද දායකත්වය සියයට 2.8 ක් විය. කෙසේද වුව ද, කෘෂිකාර්මික අංශය, පිටතින් වූ පළාත් හතරේ ද.දේ.නි. යෙන් හතරෙන් එකකට දායකත්වය ලබා දුණි. පිටතින් වූ පළාත්වල සහ ආසන්නතම පළාත්වල සේවා අංශයේ ක්‍රියාකාරීත්වය සම වේ. කෙසේවුවත්, ආසන්න පළාත්වල කාර්මික අංශයේ ක්‍රියාකාරීත්වය පිටතින් වූ පළාත්වල ක්‍රියාකාරීත්වයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ වන අතර, බස්නාහිර පළාතේ එම අංශයේ ක්‍රියාකාරීත්වයට ආසන්නව පවතී.

**සංඛ්‍යා සටහන 2**

**කලාපවල ද.දේ.නි. සංයුතිය**

ප්‍රතිශතය

| අංශය/කලාපය | බස්නාහිර | | ආසන්නතම පළාත් හතර[1] | | අනෙකුත් පළාත්[2] | | දිවයින | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2008** | **2009** | **2008** | **2009** | **2008** | **2009** | **2008** | **2009** |
| කෘෂිකර්මාන්තය | 3.1 | 2.8 | 19.8 | 18.3 | 26.4 | 25.1 | 13.4 | 12.6 |
| කර්මාන්ත | 31.7 | 32.0 | 29.7 | 30.4 | 22.9 | 22.9 | 29.4 | 29.7 |
| සේවා | 65.2 | 65.2 | 50.5 | 51.3 | 50.7 | 51.9 | 57.2 | 57.7 |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

1. මධ්‍යම, දකුණ, වයඹ හා සබරගමුව යන පළාත් ආසන්න පළාත් හතරට ඇතුළත් වේ.
2. උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ ඌව යන පළාත් පිටතින් වූ පළාත්වලට ඇතුලත් වේ.

## 8. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 |
| ජනවාරි | 183.5 | 203.1 | 216.4 | 3.0 | -0.3 | 1.4 | 20.8 | 10.7 | 6.5 | 16.4 | 21.6 | 3.1 |
| පෙබරවාරි | 188.6 | 202.9 | 216.9 | 2.8 | -0.1 | 0.2 | 21.6 | 7.6 | 6.9 | 17.0 | 20.3 | 3.1 |
| මාර්තු | 191.9 | 202.0 | 214.8 | 1.7 | -0.4 | -1.0 | 23.8 | 5.3 | 6.3 | 17.7 | 18.6 | 3.2 |
| අප්‍රේල් | 195.4 | 201.0 | 212.6 | 1.8 | -0.5 | -1.0 | 25.0 | 2.9 | 5.8 | 18.7 | 16.7 | 3.4 |
| මැයි | 198.5 | 205.1 | 215.9 | 1.6 | 2.0 | 1.6 | 26.2 | 3.3 | 5.3 | 19.8 | 14.7 | 3.6 |
| ජූනි | 205.9 | 207.8 | 217.7 | 3.7 | 1.3 | 0.8 | 28.2 | 0.9 | 4.8 | 21.0 | 12.5 | 3.9 |
| ජූලි | 206.4 | 208.7 | 217.6 | 0.2 | 0.4 | 0.0 | 26.6 | 1.1 | 4.3 | 21.9 | 10.4 | 4.2 |
| අගෝස්තු | 206.3 | 208.1 | | 0.0 | -0.3 | | 24.9 | 0.9 | | 22.6 | 8.5 | |
| සැප්තැම්බර් | 207.2 | 208.6 | | 0.4 | 0.2 | | 24.3 | 0.7 | | 23.2 | 6.6 | |
| ඔක්තෝබර් | 206.6 | 209.4 | | -0.3 | -0.4 | | 20.2 | 1.4 | | 23.4 | 5.2 | |
| නොවැම්බර් | 205.2 | 211.0 | | -0.7 | -0.8 | | 16.3 | 2.8 | | 23.0 | 4.1 | |
| දෙසැම්බර් | 203.7 | 213.5 | | -0.7 | 1.2 | | 14.4 | 4.8 | | 22.6 | 3.4 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව